ඇමුණුම් අංක - **05**

| කාර්යාල ප්‍රයෝජනය සඳහා | |
|---|---|
| ගිවිසුම් පත් අංක | |

**<u>සමෘද්ධි ආදර්ශ ගම්මාන වැඩසටහන/ විසිරුණු (තනි පුද්ගල) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව හා ව්‍යාපෘතිලාභියා අතර එළඹෙනු ලබන ගිවිසුම</u>**

මෙහි පළමු පාර්ශවය යයි කියනු ලබන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2017 අංක 2 දරණ පනතින් සංශෝධිත, 2013 අංක 01 දරණ දිවිනැගුම පනත මගින් ස්ථාපිත කරන ලද 04 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල යන ස්ථානයෙහි පිහිටි සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙනුවෙන් ........................... දිස්ත්‍රික්කයෙහි .................. ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශයෙහි, ප්‍රාදේශීය ලේකම් හෝ ඔහු විසින් බලය පවරනු ලබන සමෘද්ධි කළමනාකරු එක් පාර්ශවයකට ද,

දෙවන පාර්ශවයයැයි කියනු ලබන එම බල ප්‍රදේශයේ .............................................. (ස්ථිර ලිපිනය) හී පදිංචි, ජා. හැ. අංක ........................................... දරණ ............................................................................ (සම්පූර්ණ නම) මයා/ මිය/මෙනවිය යන අය හා (මින් මතු ව්‍යාපෘතිලාභියෙකු වශයෙන් හඳුන්වනු ලබන) අනෙක් පාර්ශවයටද බැඳි දෙපාර්ශවයේ එකඟත්වය ඇතිව වර්ෂ 20 ......... ක් වූ ...................... මස .......... වෙනි දින ඇති කර ගන්නා ලද ගිවිසුමයි.

**එකී ගිවිසුමෙහි කොන්දේසි කවරේද යත්,**

1. ඉහත ගිවිසුම් ප්‍රකාරව ආදායම් උත්පාදන කටයුතු ප්‍රවර්ධනය කිරීම පිණිස හඳුනාගන්නා ලද (ව්‍යාපෘතියේ නම) ................................ සඳහා එකී ව්‍යාපෘතිලාභියා සුදුසු වන හෙයින් පහත දක්වා ඇති ව්‍යාපෘති යෙදවුම් මතු දැක්වෙන කොන්දේසි වලට යටත්ව භාරදීමට දෙපාර්ශවය එකගවේ.
2. ඉහත ගිවිසුම් ප්‍රකාරව උක්ත ව්‍යාපෘතිය ආරම්භ කිරීම වෙනුවෙන් පහත ලේඛනයේ සඳහන් රුපියල් .............................. ක් (රු .................) වටිනා ව්‍යාපෘති/ යෙදවුම් අද දින ව්‍යාපෘති ලාභියා වෙත භාරදුන් බවට දෙපාර්ශවයම එකග වේ.
3. ඉහත ගිවිසුම් ප්‍රකාරව ලබා දෙන ලද ................................... ව්‍යාපෘතිය අඛණ්ඩ ගෙන යන බවට දෙපාර්ශවය එකගවේ.
4. ඉහත ගිවිසුම් ප්‍රකාරව ලබා ගත් එකි යෙදවුම් මෙම ව්‍යාපාතිය සඳහා පමණක් නිසි ලෙස යොදා ගනිමින් ව්‍යපෘතිය සාර්ථකව පවත්වා ගෙන යාමට දෙවන පාර්ශවය බැඳී සිටි.
5. ඉහත ගිවිසුම් ප්‍රකාරව ව්‍යාපාති ක්‍රියාත්මක කිරීමේදි ස්වාභාවික හානියක් හැර, නොසැලකිලිමත් කම නිසා ව්‍යාපෘතිට හානියක් සිදුවීමෙන් ව්‍යාපෘතිය අසාර්ථක වුවහොත්, රජය විසින් දරණ ලද මුළු මුදල දෙවන පාර්ශවය විසින් පළමු පාර්ශවයට ගෙවීමට බැඳී සිටි.
6. ඉහත ගිවිසුම් ප්‍රකාරව ආරම්භ කරන ලද ව්‍යාපෘතිය යම් හේතුවක් නිසා හානියට පත්වුවහොත් වහාම ඒ බව වසමේ සමෘද්ධි සංවර්ධන නිලධාරි හෝ (ව්‍යාපෘති/ මුලස්ථාන) කළමනාකරු වෙත සිද්ධිය සිදුවී පැය 24 ක් ඇතුලත දැනුම් දෙන බවට දෙවන පාර්ශවය එකගවේ.
7. ඉහත ගිවිසුම් ප්‍රකාරව ව්‍යාපෘතිය අධික්ෂණය හා පසුවිපරම් කිරීම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු නිලධාරීන්ටත් අනෙකුත් සහාය සේවා සපයන නිලධාරින්ටත් ඇති බව දෙපාර්ශවය පිළිගනී.

8. මෙම ගිවිසුම අනුව ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඉහත කොන්දේසි උල්ලංඝනය කිරිමෙන් හෝ කඩකිරීමෙන් මෙම දෙපාර්ශවය අතර ඇතිවන ආරවුල් හෝ ගැටළු සහගත තත්ත්වයකදි අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තීරණය අවසාන තීරණය බව දෙපාර්ශවය පිළිගනි.

මීට සාක්ෂි වශයෙන් පළමු පාර්ශවය සදහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙනුවෙන් ................................ ප්‍රාදේශිය ලේකම් හෝ බලය පවරන ලබන සමෘද්ධි කළමනාකරු සහ දෙවන පාර්ශවය වෙනුවෙන් ව්‍යාපෘතිලාභියා වර්ෂ ........ ක් වූ ................ මස ....... වැනි දින .................................. හීදී අත්සන් තබන ලදි.

**පළමු පාර්ශවය**

....................................
(අත්සන)
මුලස්ථාන / ව්‍යාපෘති කළමනාකරු
(නිල මුද්‍රාව )
දිනය :

**දෙවන පාර්ශවය**

.............................................
(අත්සන)
ව්‍යාපෘතිලාභියා
ජා. හැ. ප. අංකය. ...........................
දිනය :

**පළමු පාර්ශවය වෙනුවෙන් අත්සනට සාක්ෂි**

........................................
(අත්සන)
නම
ජා.හැ.ප. අංකය: .............................

**පළමු පාර්ශවය වෙනුවෙන් අත්සනට සාක්ෂි**

..................................................
(අත්සන)
නම
ජා.හැ.ප. අංකය: .........................